ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම

லங்கா லேலண்ட் லிமிடட் (சொந்த)

# LANKA LEYLAND (PRIVATE) LIMITED

2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා

31 மார்ச் 2015 முடிவடைந்த ஆண்டுக்கான

FOR THE YEAR ENDED 31ST MARCH 2015

වාර්ෂික වාර්තාව

நிதி அறிக்கைகள்

# ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම

2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා

වාර්ෂික වාර්තාව

**අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව**

2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්තාව ඔබ වෙත පිලිගන්වන්නෙමි.

**ආයතනයේ ක්‍රියාකාරකම්**

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ අප විසින් විශාල ආයෝජනයක් සිදු කර ඇති ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගම් මෙහෙයුම් කටයුතු අධික්ෂණය කිරීමයි.

**වසරේ විශ්ලේෂණය**

2015 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා

| ආදායම් | සටහන් | 31/03/2015<br>රු. |
|---|---|---|
| පොලී ආදායම | | 4,296,301.85 |
| පරිපාලන වියදම් | | (2,611,253.70) |
| ආශ්‍රිත සමාගම්වල අයෝජනයෙන්ලද ලාභය | | 12,100,000.00 |
| වෙනත් වියදම් | | (3,664.49) |
| මෙහෙයුම් ලාභය / අලාභය | | **13,781,383.66** |
| මූල්‍ය ආදායම් | | 6,806,250.00 |
| බදු පෙර ලාභය / අලාභය | | 20,587,633.66 |
| බදු වියදම | | (781,927.00) |
| බදු පසු ලාභය / අලාභය | | **19,805,706.66** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් | | **19,805,706.66** |

**අධ්‍යක්ෂක මණ්ඩලය**

| | | |
|---|---|---|
| වයි.එල්.එස්. හමීඩ් මහතා | - | සභාපති |
| බී.එම්. රියාජ් මහතා | - | අධ්‍යක්ෂක |
| එස්. ලියායුඩීන් මහතා | - | අධ්‍යක්ෂක |
| එස්. ආනන්දරාසා මහතා | - | අධ්‍යක්ෂක |
| කේ.එම්.රිස්වි මහතා | - | අධ්‍යක්ෂක |
| ජේ.එච්.එම් අන්වර් මහතා | - | අධ්‍යක්ෂක |
| පී.එම්.කෙ. හෙට්ටිආරච්චි මහතා | - | අධ්‍යක්ෂක |
| ජස්රි ජවබ්දීන් මහතා | - | අධ්‍යක්ෂක |

**ලාභාංශ**

වර්ෂය සඳහා ලාභාංශ වශයෙන් රු. 11,000,000.00 ගෙවා ඇත.

**සමාගම සමඟ අධ්‍යක්ෂක මණ්ඩලය ඇති කර ගන්නා ගිවිසුම්**

මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 17 හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගම සමඟ කර ගන්නා ගිවිසුම් දක්වා ඇත.

**විගණකවරු**

එම්.එස්. ක්‍රෙස්ටන් එම්.එන්.එස්. සහ සමාගම විසින් ගිණුම් විගණනය කරන ලදී. ඔවුන් ඊලඟ වර්ෂය සඳහා පත්වීමට කැමැත්ත පල කර ඇත.

අධ්‍යක්ෂක පරිදි
අණ පරිදි
අත්සන් කළා

# ලංකාලේලන්ඩ්පුද්ගලිකසමාගමෙහිකොටස්හිමියන්වෙත ස්වාධීනවිගණකගේවාර්තාව

## 01. මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන, එනම් 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පිටු අංක 07 සිට 16 දක්වා අන්තර්ගත වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක්ද වෙනත් පැහැදිලි කිරීම් වලින් සමන්විත සටහන් ද අප විසින් විගණනය කරන ලදී.

## 02. මූලය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ වගකීම්

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ටඅනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් වේ. අධ්‍යක්ෂක මණ්ඩලය අදහස් කරන පරිදි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අභ්‍යන්තර පාලනය අත්‍යවශ්‍යය වේ.

## 03. විගණන විෂය පථය සහ මතය ප්‍රකාශ කිරීමේ පදනම

අපගෙ වගකීම වනුයෙ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය පවත්වගෙන යන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. අදාළ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් තොර බවට සාදාරණ තහවුරුවක් ලබාදීම සඳහා විගණනය සැලසුම් කර පවත්වාගෙන යන ලදී.

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ප්‍රමාණාත්මක හෙළිදරව් කිරිමේ විගණන සාක්ෂි ලබා ගන්නා ක්‍රියාපටිපාටි විගණනයේ ඇතුළත් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල අඩංගු ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන පැවැතීමේ අවධානම් තක්සේරුව මත හා තෝරාගත් ක්‍රියාපටිපාටි මත විනිශ්චය රඳා පවතී. අවධානම් තක්සේරුවේදී, විගණක අදහස අනුව මූල්‍ය ප්‍රකාශනසැකසීම් දී ආයතනයට අදාල අභ්‍යන්තර පාලනය මත එය සත්‍ය හි සාධාරණ දැක්මකින් එය සිදු කර ඇති බවත් නමුත් එය ආයතනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළබඳ මතකයක් ප්‍රකාශ කිරිම අරමුණ නොවන බවත් දැක්විය යුතුය. ඒ අනුව විගණනයේ දි භාවිත වන ගිණුම් ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය හා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්පාදිත ගිණුම් ඇස්තමේන්තු ඇගයීමකට ද ලක් වේ. එමෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ද ඇගයීමට ලක්වේ. අපගේ විගණනයේදි ලබාගත් විගණන සාක්ෂි අපගේ විගණන මතයට පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍යවත් වන බවට අප විශ්වාස කරන්නේමු.

පිටු අංක 02

**මතය**

අපගේ මතය අනුව, 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය හා වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත.

**කරුණක් අවධාරණය කිරීම**

අපගේ මතය තත්වාගණනය නොකර මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 04 කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ අනුව එහි සඳහන් භූමිය වර්තමානයේ සමාගම භාවිතයේ නැති බවට අප විසින් අවධාරණය කරන්නෙමු.

**අනෙකුත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව**

අපගේ මතය අනුව මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල පහත සටහන් දැක්විය හැක.

01. විගණන මතය හා විගණන විෂය පතය හා එහි සීමාවන් ඉහත දක්වා ඇත.
02. අපගේ සමාලෝචනය

- අපගේ විගණනය මතයට අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් සමාගම විසින් ලබා දී ඇති අතර අපගේ විගණන දර්ශනය අනුව සමාගම විසින් විධිමත් නිසි ගිණුම් වාර්තා තබා ගෙන ඇත.
- මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අනුකූලතාව දක්වා ඇත.

ක්‍රෙස්ටන් එම් එන් ඒ එස් සහ සමාගම
වරලත් ගණකාධිකාරී
කොළඹ

**ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම**
**2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | සටහන් | 31/03/2015 රු. | 31/03/2014 රු. |
|---|---|---|---|
| **වත්කම** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4 | **627,869.00** | 631,160.50 |
| ආශ්‍රිත සමාගම් වල ආයෝජන | 5 | **1,966,250,000.00** | 1,954,150,000.00 |
| | | **1,966,877,869.00** | 1,954,781,160.50 |
| **ජංගම වත්කම්** | | | |
| අයෝජන | 6 | **23,819,435.60** | 56,313,654.09 |
| බැංකු මුදල් | 8 | **36,822,867.47** | 7,789,109.70 |
| | | 60,642,303.07 | 64,102,763.79 |
| මුළු වත්කම් | | 2,027,520,172.07 | 2,018,883,924.29 |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 9 | **8,958,600.00** | **8,958,600.00** |
| පොදු සංචිත | 10 | **9,800,924.00** | **9,800,924.00** |
| රඳවාගත් ලාභ | | **2,008,320,567.31** | **1,999,514,860.65** |
| | | **2,027,080,091.31** | 2,018,274,384.65 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 11 | **55,780.00** | 47,295.00 |
| ගෙවිය යුතු ආදායම් බදු | 12 | **384,300.76** | 562,244.64 |
| | | **440,080.76** | 609,539.64 |
| මුළු ස්කන්ධය හා වගකීම් | | **2,027,520,172.07** | 2,018,883,924.29 |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 07 සිට පිටු අංක 16 දක්වා සටහන් ඇතුළත් කර ඇත.

ඉහත මූල්‍ය ප්‍රකාශනය 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළියෙළ කර ඇති බවට මම විසින් සහතික කරමි.

..............................

මූල්‍ය පාලක

2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

අධ්‍යක්ෂවරු 01.

02.

15 සැප්තැම්බර් 2015

**සීමාසහිතලංකාලේලන්ඩ්(පුද්ගලක) සමාගම**
2015මාර්තු 31 දිනෙන්අවසන්වර්ෂයසඳහා

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| ආදායම් | සටහන් | 31/03/2015<br>රු. | 31/03/2014<br>රු. |
|---|---|---|---|
| පොලී ආදායම | | 4,296,301.85 | 7,781,798.07 |
| පරිපාලන වියදම් | | (2,611,253.70) | (2,444,313.10) |
| ආශ්‍රිත සමාගම්වල අයෝජනයෙන්ලද ලාභය | | 12,100,000.00 | (644,022,500.00) |
| වෙනත් වියදම් | | (3,664.49) | (3,443.70) |
| මෙහෙයුම් ලාභය / අලාභය | | 13,781,383.66 | (638,688,458.73) |
| මූල්‍ය ආදායම් | 13 | 6,806,250.00 | 13,612,500.00 |
| බදු පෙර ලාභය / අලාභය | 14 | 20,587,633.66 | (625,075,958.73) |
| බදු වියදම | 15 | (781,927.00) | (1,498,505.00) |
| බදු පසු ලාභය / අලාභය | | 19,805,706.66 | (626,574,463.73) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් | | 19,805,706.66 | (626,574,463.73) |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 07 සිට පිටු අංක 16 දක්වා සටහන් ඇතුළත් කර ඇත.

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම
2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රකාශිතප්‍රාග්ධනය (රු.) | පොදු සංචිත (රු.) | රඳවාගත් ලාභය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| 2013 අප්‍රේල් 01 දිනට ශේෂය | 8,958,600.00 | 9,800,924.00 | 2,643,089,324.38 | 3,188,567,304.27 |
| ලාභාංශය | - | - | (17,000,000.00) | (17,000,000.00) |
| අයිතිකරුවන් සමඟ වූ ගනුදෙනු | | | (17,000,000.00) | (17,000,000.00) |
| වර්ෂය සඳහා අලාභය | - | - | (626,574,463.73) | (626,574,463.73) |
| වර්ෂය සඳහා ලාභය වන වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - |
| **වර්ෂය සඳහා වන මුළු විස්තීර්ණ ආදායම්** | - | - | (626,574,463.73) | (626,574,463.73)) |
| **2014මාර්තු 31 දිනට ශේෂය** | **8,958,600.00** | **9,800,924.00** | **1,999,514,860.65** | **2,018,274,384.65** |
| ලාභාංශය | - | - | (11,000,000.00) | (11,000,000.00) |
| අයිතිකරුවන් සමඟ වන ගනුදෙනු | | | **(11,000,000.00)** | **(11,000,000.00)** |
| වර්ෂය සඳහා වන ලාභය | - | - | 19,805,706.66 | 19,805,706.66 |
| වර්ෂය සඳහා වන වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - |
| ෂය සඳහා වන මුලු විස්තීර්ණ ආදායම | | | 19,805,706.66 | 19,805,706.66 |
| **2015මාර්තු 31 දිනට ශේෂය** | **8,958,600.00** | **9,800,924.00** | **2,008,320,567.31** | **2,027,080,091.31** |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 07 සිට පිටු අංක 16 දක්වා සටහන් ඇතුළත් කර ඇත

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| ආදායම | සටහන් | 31/03/2015 රු. | 31/03/2014 රු. |
|---|---|---|---|
| **අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | |
| බදු පෙර ලාභය | | 20,587,633.66 | (625,075,958.73) |
| **ගැලපීම්** | | | |
| ක්ෂය | 4 | 3,291.50 | 3,291.50 |
| පොලී ආදායම | | (4,296,301.85) | (7,781,798.07) |
| ලාභාංශ ආදායම | 13 | (6,806,250.00) | (13,612,500.00) |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභය / අලාභය | | (12,100,000.00) | 644,022,500.00 |
| මුළු ගැලපීම් | | (23,199,260.35) | 622,631,493.43 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හි වෙනස්වීම් | 11 | 8,485.00 | (21,165.00) |
| **කාරක ප්‍රාග්ධනයෙහි මුළු වෙනස්වීම්** | | 8,485.00 | (21,165.00) |
| ආදායම් බදු ගෙවීම් | 12 | (959,870.88) | (2,007,307.13) |
| පොලී ලැබීම් | | 4,316,456.18 | 10,516,626.14 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රමාණය** | | 753,443.61 | 8,509,319.01 |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | | |
| ආයෝජන මිලදී ගැනිම | 6 | 32,474,064.16 | (94,310.37) |
| ලාභාංශ ලැබීම් | 13 | 6,806,250.00 | 13,612,500.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | 39,280,314.16 | 13,518,189.63 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | | |
| ලාභාංශ ගෙවීම් | | (11,000,000.00) | (17,000,000.00) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය | | (11,000,000.00) | (17,000,000.00) |
| **මුදල් හා මුදල් සමාන දෑ හි වෙනස් වීම්** | | 26,430,616.08 | 2,561,878.34 |
| **අප්‍රේල් 01 වන දිනට මුදල් හා මුදල් සමාන දෑ** | 8 | 7,789,109.70 | 5,227,231.36 |
| **මාර්තු 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | 36,822,867.47 | 7,789,109.70 |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 07 සිට පිටු අංක 16 දක්වා සටහන් ඇතුළත් කර ඇත

# ලංකාලේලන්ඩ්පුද්ගලිකසමාගම

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### සටහන් අංක - 01

**I. ආයතනික තොරතුරු**

සීමාසහිත ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ පිහිටුවා 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත සංස්ථාපනය කර ඇති අංක 80/12, රබර් වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ යන ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරි ස්ථානය පිහිටා ඇති සීමිත පුද්ගලික සමාගමකි.

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ භාණ්ඩාගාර බිල්පත්වල සහ ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීමයි.

### සටහන් අංක - 02

**I. පොදු තොරතුරු සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමේ වාර්තාව**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මෙය සමාගමේ ක්‍රියාකාරී මුදල් ඒකකය වේ.

අධ්‍යක්ෂකවරුන් විසින් නුදුරු අනාගතයේදී පවතින ව්‍යාපාරයක් ලෙස දිගටම පවත්වාගෙන යාම සඳහා සමාගමට ඇති හැකියාව පිළිබඳ තක්සේරු කිරීම සිදු කර ඇති අතර ඔවුන් සමාගම ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අපේක්ෂා නොකරයි.

**03. ගිණුම්කරණ ප්‍රමිතිවල සාරාංශය**

**03.01. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සමස්ථ භාවිතය**

කාලච්ඡේදය අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත පරිදි සාරාංශ කර ඇත. මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති කාලපරිච්ඡේදය පුරාභාවිතා කර ඇත.

**03.02. ආශ්‍රිත සමාගම්වල අයෝජන**

සමාගම් විසින් සිදු කර ඇති ආයෝජනයන්ගේ අගය මත එකී සමාගම්වල පාලනය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කල හැකි ආයෝජනයන් ආශ්‍රිත සමාගම්හි අයෝජනයන් ලෙස ගිණුම්කරණය කර ඇති අතර බද්ධ ව්‍යාපාරය හා පරිපාලිත සමාගම් මෙයට ඇතුළත් නොවේ. මෙම අයෝජනයන්, සිදු කරන ලද ආයෝජනයේ පිරිවැයට පළමුව හඳුනාගෙන ඇති අතර ඉන්පසු ඒවායේ සාධාරණ අගයට ගිණුම්ගත කර ඇත.

# සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

## 03.03. ආදායම

**පොලී ආදායම සහ ලාභාංශ ආදායම**

පොලී ආදායම උපචිත පදනමින් හඳුනාගෙන ඇත. ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත්තේ ලාභාංශ ආදායම ලැබීමට අදාළ හිමිකම ලැබීමෙන් පසුවය.

## 03.04. දේපල පිරියත උපකරණ

දේපල පිරියත උපකරණ සඳහා දැරූ පිරිවැයෙන් දැරූ පිරිවැයේ ඒවායේ ක්ෂයවීම් සහ හානි කරන අලාභ අඩු කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

දේපල පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරන අතර ඒවායේ ඵලදායී ජීව කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.

| වත්කම | වර්ෂය |
|---|---|
| කාර්යාල උපකරණ | 4 |

ක්ෂය අනුපාතය, ප්‍රයෝජනවත් ජීවිතය කාලය හෝ වත්කම් සුන්බුන් අගය සැලකිය යුතු වෙනසක් ඇති වී තිබෙන බව පෙන්නුම් කරන පවතී නම්, එම වත්කම් ක්ෂය අනාගත නව අපේක්ෂාවන් පිළිබිඹු කිරීම සංශෝධනය කර ඇත.

## ගිණුම් ප්‍රතිපත්තියේ සමස්ථ භාවිතය

## 03.05. වත්කම් වන හානිකරණය

සමහර මුදල් උත්පාදන ඒකක මට්ටමින් පරීක්ෂා කරනු ලැබේ

සමාගම විසින් සෑම ගිණුම්කරණ වර්ෂයකට වරක් වත්කම් හානිකරණය වී ඇති බවට කිසියම් හෝ පෙන්නුම් කිරීමක් සමාගමේ සිදු වී ඇත්දැයි තක්සේරු කළ යුතුය. එවැනි හානිකරණ ලක්ෂණයන් පෙන්නුම් කරන විටදී හෝ සමාගම විසින් තීරණය කරන ලද වෙනත් අවස්ථාවකදී සමාගම විසින් තම දේපල, පිරියත හා උපකරණ වල නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කළ යුතුය.

මෙහිදී වත්කම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහය වෙන වෙනම හඳුනා ගත නොහැකි නම් සමාගම විසින් එම වත්කම් අන්තර්ගත වන සමස්ථ ඒකකයම සලකා බලා වත්කමේ නැවත අයකර ගත හැකි අගය තීරණය කළ යුතු අතර, නැවත අයකරගත හැකි අගය ලෙස අදාළ වත්කමේ අනාගත භාවිතයෙන් ජනිත වන මුදල් ප්‍රවාහය වට්ටම් කර ලැබෙන අගය හා අදාළ වත්කමේ ධාරණ අගය යන දෙකෙන් වැඩි අගය ගත යුතුය.

# සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

එසේ ගණනය කරන ලද නැවත අයකර ගත හැකි වත්කමේ ධාරණ අගය හා සැසඳිය යුතු අතර එම සැසඳීමේ ධාරණ අගය වත්කමේ නැවත අයකරගත හැකි අගයට වඩා වැඩි නම් එම වැඩි ප්‍රමාණය හානිකරණ අලාභය ලෙස සලකා කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට ලියාහල යුතුය.

හානිකරණයට ලක්වූ වත්කමක නැවත අයකර ගත හැකි සාධාරණය වැඩි වී ඇතැයි තක්සේරු කළ හැකි අවස්ථාවකදී පෙර වර්ෂයේ ලාභයට එරෙහිව කපාහළ හානිකරණ අලාභයට සමාන ප්‍රමාණයක් අදාළ කාලපරිච්ඡේදයේ ආදායමට මාරු කළ යුතුය.

## 03.06. මූල්‍ය උපකරණ

<u>මූල්‍ය වත්කම්</u>

**<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**

මුදල් හා මුදල් සමාන දෑ ඒවායේ ගනුදෙනු වටිනාකමට අගය කර ගිණුම්ගත කර ඇත.

**<u>අනෙකුත් කෙටි කාලීන මූල්‍ය වාර්තා</u>**

අනෙකුත් කෙටි කාලීන මූල්‍ය වත්කම් යන්නට ස්ථාවර තැන්පත් හි කරන ලද ආයෝජන හා භාණ්ඩාගාර බිල්පත් කරන ලද ආයෝජනයන් සමන්විත වේ.

මෙම වත්කම් ද පළමුව ගනුදෙනු වටිනාකමට ගිණුම් ගත කර ඇති අතර පසුව සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ක්‍රමක්ෂය පිරිවැයට වාර්තා කර ඇත.

**මූල්‍ය වගකීම්**

සමාගමේ මූල්‍ය වගකීම් යන්නට වෙළඳ හා අනෙකුත් වෙළද නොවන ජංගම බැරකම් අන්තර්ගත වන අතර පළමුව ඒවායේ ගනුදෙනු අගය මත ගිණුම්ගත කර ඇත. පසුව සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ මිනුම් කරන ලද පිරිවැය ගිණුම්ගත කර ඇත. මෙහිදී වෙළඳ ණයහිමියන් යන්නට සාමාන්‍ය ණය කාල සීමා යටතේ කරන ලද, පොලී අය නොකරන මූල්‍ය වගකීම් වේ.

## 03.07. ආදායම් බදු

කාලච්ඡේදය අදාළ ආදායම් බද්ද ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර ආදායම් බදු සම්බන්ධයෙන් කිසිම ගැලපීමක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හෝ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ගලපා නැත.

කාලච්ඡේදයේ උපයන ලද ආදායම මත ගෙවිය යුතු / වැඩිපුර ගෙවූ හා පෙර වර්ෂවලට අදාළ හිඟ හෝ අතිරික්ත බද්ද බදු වලින් ශේෂ පත්‍ර දිනට සමාගම සතුව පවතින බදු බැරකම හෝ වැඩිපුර ආදායම් බදු ප්‍රමාණය පෙන්නුම් කරන අතර කාලච්ඡේදයට අදාළ බදු වියදම ආදායම් පෙන්නුම් කෙරේ.

## සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 03.08. ස්කන්ධය, සංචිත සහ ලාභාංශ ගෙවීම

නිකුත් කල ඇති කොටස් මත මුදලින් ලද හෝ ඇරයුම් කල ඇති මුලු ප්‍රමාණය සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස ගිණුම් ගත කර ඇත.

සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන් සමාගම විසින් කලින් කලට ප්‍රකාශ කරනු ලබන ලාභාංශ ලැබීම සඳහා හිමිකම ලබන අතර එක් සාමාන්‍ය කොටසකට එක් ඡන්දය බැගින් හිමි වේ.

### 03.09. කෙටි කාලීන සේවක ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේදී ප්‍රතිලාභ

<u>සේවය අවසන් කිරීමේ සේවක ප්‍රතිලාභ</u>

සමාගමේ සේවකයන් සිය සේවය හමාර කිරීමේදී ගෙවිය යුතු හමාර කිරීමේදී ප්‍රතිලාභ සඳහා විවිධ දායකත්ව ක්‍රම සමාගම විසින් සිදු කරනු ලබයි.

නිර්ණය කරන ලද දායකත්ව සැලසුම්, සේවකයන් සේවය හමාර කිරීමේදී ගෙවිය යුතු ප්‍රතිලාභ සඳහා සමාගම විසින් ක්‍රියාත්මක කරන සැලසුමක් මත වන අතර ඒ සඳහා සමාගම විසින් වෙනම ඒකකයක් පිහිටුවා ඇති අතර එයට අදාළ මුදල බැර කිරීම සිදු කරයි. තවද ඊට දායකත්ව මුදල් දරණ කාලච්ඡේදයේදී වියදමක් ලෙස ආදායම ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර දායක මුදල් වලින් ඔබ්බට විහිදුන නෛතික හෝ වෙනයම් බැදියාවක් නොමැත.

සේවකයාගේ ද දල පරිශ්‍රමිකනේ 12%, 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සේවක භාරකාර අරමුදලට බාර කරයි.

<u>කෙටි කාලීන සේවක ප්‍රතිලාභ</u>

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ යන්නට සේවකයන් හා සම්බන්ධ උපචිත වැටුප් වේතන හා අනෙකුත් ආශ්‍රිත ප්‍රතිලභ ඇතුලත් වන අතර ඒවා සමාගම විසින් ගෙවීමේදී පිටපත ගලා යන මුදල් ප්‍රමාණය මත වට්ටම් කිරීමකින් තොරව ගිණුම් ගතකර ඇත. එනම්, ඒවායේ නාමික අගයට ගිණුම්ගත කර ඇත.

## සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 03.10. ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කිරීමේදී හා අවිනිශ්චිතතා තක්සේරුවේ දී කළමණාකාරීත්වය විසින් ගෙන ඇති විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනා ගැනීමට හා අගය කිරීම සඳහා කළමණාකරණය විසින් විවිධ ඇස්තමේන්තු විනිශ්චයන් හා උපකල්පනයන් යොදාගෙන ඇත.

<u>**ප්‍රමාණාත්මක කළමණාකාරීත්වයේ විනිශ්චයන්**</u>

පහත සඳහන් කළමනාකරණ විනිශ්චයන් මගින් මූල්‍ය ප්‍රකාශන මත ඍජු හා ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කරනු ලබයි.

**අවිනිශ්චිතතාව හා තක්සේරු කිරීම**

පහත සඳහන් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් අගය කිරීමේ දී හා හඳුනා ගැනීමේදී අදාළ ඇස්තමේන්තු හා උපකල්පනවලට අදාළ තොරතුරුවල සාධාරණත්වය ඉතා ඉහළ කාර්යභාරයක් සිදු කරයි. එසේ වුවද සත්‍ය ප්‍රතිඵල හා මෙම ඇස්තමේන්තුගත තොරතුරු අතර ප්‍රමාණාත්මක වෙනසක් තිබිය හැක.

<u>**හානිකරණය**</u>

හානිකරණ අලාභ ගණනය කිරීමේදී කළමනාකරණය විසින් යම් තනි වත්කමක ධාරණ අගය හෝ මුදල් උත්පාදන ඒකකයක් අනාගත මුදල් වට්ටම් කිරීම සඳහා පොලී අනුපාතයක් (වට්ටම් සාධකයක්) ඇස්තමේන්තු කළ යුතු අතර එමගින් එම වත්කමෙහි හෝ මුදල් උත්පාදනය ඒකකයේ අයකරගත හැකි අගය ගණනය කරනු ලබයි. මෙසේ ගණනය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහය හෝ වට්ටම් සාධකය ඇස්තමේන්තු කිරීමේදී අවිනිශ්චිතා තක්සේරු කිරීමක් සිදු කළ යුතුය.

<u>**ක්ෂය වන වත්කම්වල ඵලදායි ජීවිත කාලය ගණනය කිරීම**</u>

සෑම ගිණුම් කාලච්ඡේදයක් තුළදීම කළමණාකාරීත්වය විසින් ක්ෂය වන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කළ යුතු අතර මෙහිදී යල් පැනයාම් යනාදිය පිළිබඳ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගත යුතුය. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතතා අදාල තාක්ෂණික උපයෝගිතා තාක්ෂණික යල් පැනීම් හේතුවෙන් වෙනස් විය හැක.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

සටහන් - 04 - දේපල පිරියත හා උපකරණ

| | සින්නක්කර ඉඩම (රු.) | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|
| දළ ධාරණ අගය | | | |
| අප්‍රේල් 01 වන දිනට ශේෂය | 626,473.00 | 13,166.00 | 639,639.00 |
| මාර්තු 31 වන දිනටශේෂය | **626,473.00** | **13,166.00** | **639,639.00** |
| උපචිත ක්ෂය සහවත්කම් හානිකරණය | | | |
| අප්‍රේල් 01 වනදිනට ශේෂය | - | 8,478.50 | 8,478.50 |
| වර්ෂය තුළ ක්ෂයවීම් | - | 3,291.50 | 3,291.50 |
| මාර්තු 31 වන දිනටශේෂය | | 11,770.00 | 11,770.00 |
| **අප්‍රේල් 01 වනදිනට ඉදිරියට ගෙන ආ ශේෂය 2014** | **626,473.00** | **4,687.50** | **631,160.50** |
| **මාර්තු 31 වන දිනටඉදිරියට ගෙන ආ ශේෂය 2015** | **626,473.00** | **1,396.00** | **627,869.00** |

- වර්තමානයේ මෙම භූමිය සමාගම භාවිතයේ නොමැත.

සටහන් අංක - 05 - ආශ්‍රිත සමාගමේ කර ඇති ආයෝජන

සාධාරණ අගය ක්‍රමය

| | කොටස් ගණන | පැවති 2014 % | 2013 % | 31.03.2015 | 31.03.2014 |
|---|---|---|---|---|---|
| ලංකා අශෝක් ලේලන්ඩ්පුද්ගලික සමාගම | 1512500 | 42% | 42% | 1,966,250,000.00 | 1,954,150,000.00 |
| | | | | 1,966,250,000.00 | 1,954,150,000.00 |
| ආශ්‍රිත සමාගම්වලින් ලද ලාභාංශ (මූල්‍ය ආදායම් දඇතුළත්ව) | | | | 6,806,250.00 | 13,612,500.00 |

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**සටහන් අංක 06 - ආයෝජන**

| | 31.03.2015 | 31.03.2014 |
|---|---|---|
| ස්ථාවර තැන්පතු -මහජන බැංකුව | - | 32,500,000.00 |
| - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 21,156,133.00 | 21,172,500.00 |
| භාණ්ඩාගාර බිල්පත් -ලංකා බැංකුව | 2,663,302.60 | 2,641,154.09 |
| | 23,819,435.60 | 56,313,654.09 |

**සටහන් අංක - 07 - මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්**

**මූල්‍ය වත්කම්**

**පිරිවැයෙන් හානිකරණ අලාභ අඩුකර දක්වා ඇති**
**මූල්‍ය වත්කම්**

| | | |
|---|---|---|
| අයෝජන - (සටහන් අංක 06) | 23,819,435.60 | 56,313,654.09 |
| බැංකු මුදල් - (සටහන් අංක 08) | 36,822,867.47 | 7,789,109.70 |
| එකතුව | 60,642,303.07 | 64,102,73.79 |

**මූල්‍ය වගකීම්**

**සාධාරණඅගය වෙනස් වීම ලාභලාභ ගිණුමේ ගලපන ලද**
**මූල්‍ය වගකීම්**

| | | |
|---|---|---|
| වත්කමේඅගයේ අගය තවත් වත්කමක් මත රඳා පවතින මූල්‍ය උපකරණ | - | - |
| එකතුව | - | - |

**මූල්‍ය වගකීම්**

| | | |
|---|---|---|
| වෙනත් ගෙවිය යුතුවියදම් - උපචිත වියදම්(සටහන් - 11) | 55,780.00 | 47,295.00 |
| එකතුව | 55,780.00 | 47,295.00 |

**සටහන් අංක - 08 - මුදල් හා මුදල් සමාන දෑ**

| | | |
|---|---|---|
| බැංකු මුදල් | 36,822,867.47 | 7,789,109.70 |
| | 36,822,867.47 | 7,789,109.70 |

## ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### සටහන් අංක - 09 - ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් වලින් ගිණුම්ගත කර ඇත.

සමාගමේ කොටස් හිමියන්ට කලින් කලට අනුමත කරන පරිදි ලාභාංශ ලැබීමට හිමිකම් ලැබෙන අතර, එක් කොටස් හිමියෙකුට එක් ඡන්දයක් මඟින් වාර්ෂික මහා සභා රැස්වීමකදී ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම හිමි වේ.

| | 31/03/2015<br>රු. | 31/03/2014<br>රු. |
|---|---|---|
| **නිකුත් කල සහ ගෙවිනිමි කොටස් ප්‍රමාණය** | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 2,150,000.00 | 2,150,000.00 |
| මාර්තු 31 දිනට ශේෂය | 2,150,000.00 | 2,150,000.00 |

| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 31/03/2015<br>රු. | 31/03/2014<br>රු. |
|---|---|---|
| ප්‍රකාශිතප්‍රාග්ධනය | 15,750,000.00 | 15,750,000.00 |
| (-) අඩු කලා - හිඟහිටි ඇරයුම් | (6,791,400.00) | (6,791,400.00) |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 8,958,600.00 | 8,958,600.00 |
| මාර්තු 31 දිනට ශේෂය | 8,958,600.00 | 8,958,600.00 |

### සටහන් අංක - 10 - පොදු සංචිත

| | | |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 9,800,924.00 | 9,800,924.00 |
| මාර්තු 31 දිනට ශේෂය | 9,800,924.00 | 9,800,924.00 |

පොදු සංචිතය සාමාන්‍ය භාවිතය සඳහා තබා ගන්නා මුදල් ප්‍රමාණය නියෝජනය කරනු ලබයි.

### සටහන් අංක - 11 - වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

| | | |
|---|---|---|
| **මූල්‍ය වගකීම්** | 55,780.00 | 47,295.00 |
| **උපචිත වියදම්** | 55,780.00 | 47,295.00 |

## ලංකාලේලන්ඩ්පුද්ගලිකසමාගම
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### සටහන් අංක - 12 - ආදායම් බදු වගකීම්

| | 31/03/2015 | 31/03/2014 |
|---|---|---|
| | රු. | රු. |
| අප්‍රේල් 01 දිනටශේෂය | 562,244.64 | 1,071,046.77 |
| වර්ෂය සඳහා වෙන්කිරීම | 781,927.00 | 1,498,505.00 |
| පෙර වර්ෂයේ අඩි වෙන්කිරීම | 1,344,171.64 | 2,569,551.77 |
| වර්ෂය තුල කල ගෙවීම් | (562,244.00) | (1,071,046.00) |
| කල්පිත බදු බැර | (19,316.88) | (28,601.13) |
| රඳවා ගැනීමේ බදු | (378,310.00) | (907,660.00) |
| මාර්තු 31 දිනට ශේෂය | 384,300.76 | 562,244.64 |

| | |
|---|---|
| 2014 / 2015 තක්සේරු වර්ෂය සඳහා ආදායම් ගෙවිය යුතු ආදායම් බද්ද | 384,300.00 |
| | 384,300.00 |

### සටහන් අංක - 13 - මූල්‍ය ආදායම

| | | |
|---|---|---|
| **ආශ්‍රිතයන්ගෙන් ලාභාංශ ලැබීම්** | 6,806,250.00 | 13,612,500.00 |
| **මූල්‍ය ආදායම** | 6,806,250.00 | 13,612,500.00 |

### සටහන් අංක - 14 - බදු පෙර ලාභ / අලාභ

| | 31/03/2015 | 31/03/2014 |
|---|---|---|
| | රු. | රු. |
| අධ්‍යක්ෂක දීමනා | 600,000.00 | 600,000.00 |
| අධ්‍යක්ෂක ගාස්තු | 225,500.00 | 246,800.00 |
| විගණන ගාස්තු - විගණනය සඳහා | 55,780.00 | 47,295.00 |
| පෙර වර්ෂය සඳහා ඌනවෙන් කිරීම | 1,210.00 | 1,626.00 |
| සේවක පිරිවැය | 458,000.00 | 260,000.00 |
| සේවක අර්ථසාධක භාභාරකාර දායකය | 190,800.00 | 185,400.00 |
| ක්ෂය වීම් | 3,291.50 | 3,291.50 |

## ලංකාලේලන්ඩ්පුද්ගලිකසමාගම
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**සටහන් අංක - 15 - ආදායම් බදු වියදම**

15.01.2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සඳහන් වන පරිදි සමාගම විසින් බදු අය වන ආදායමෙන් 28% ආදායම් බදු ලෙස වෙන් කොට ගෙවිය යුතුය.

| | 31/03/2015 | 31/03/2014 |
|---|---|---|
| | රු. | රු. |
| වර්ෂයේ ලාභය | 781,927.00 | 1,498,505.00 |
| | 781,927.00 | 1,498,505.00 |

**15.02. බදු වියදම සහ ගිණුම්කරණ ලාභය / අලාභය සැසඳීම**

| | | |
|---|---|---|
| ආදායම් බදු සඳහා ගිණුම්කරණ ලාභය / අලාභය | 20,587,634.00 | (625,075,959.00) |
| අයකල හැකි ලාභය මතබදු බැදියාව | 5,764,538.00 | (175,021,268.00) |
| නිදහස් ආදායම මත බදුබැදියාව | (5,293,750.00) | (3,811,500.00) |
| ඉඩ නොදෙන වියදම් මතබදු බැදියාව | 80,022.00 | 180,331,973.00 |
| ඉඩ නොදෙන වියදම් මතබදු බැදියාව | (700.00) | (700.00) |
| පසුගිය වර්ෂය සඳහා ආදායම් හා අව වෙන් කිරීම පෙර වර්ෂය | - | - |
| | 781,927.00 | 1,498,505.00 |

15.03. ප්‍රමාණාත්මක තාවකාලික වෙස්කම් නොමැති නිසා විලම්භිත බදු සඳහා වෙන් කිරීමක් කර නොමැත.

16.00 වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදුවන සිදුවීම්

17.00 සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු.

17.01. ඉහළ කළමණාකරණ සමඟ ගනුදෙනු

ඉහළ කළමණාකරණ පුද්ගලයින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතුළත් වේ.

ඉහළ කළමණාකරණ පුද්ගලයින් සඳහා ගෙවීම්.

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2014 (රු) | 2013 (රු.) |
|---|---|---|
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 825,500.00 | 846,800.00 |

ඉහළ කළමණාකරුවන්ගේ පවුලේ සාමාජිකයන් සමඟ සිදුකරන ගනුදෙනු

ඉහළ කළමණාකරුවන් සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයන් සමඟ සිදුවූ ගනුදෙනු වර්ෂය තුළ සිදුකර නොමැත.

**18.00 අසම්භාව්‍ය වත්කම් හා වගකීම්**

2015 මාර්තු 31 දිනට අසම්භාව්‍ය වත්කම් හා වගකීම් කිසිවක් නොමැත.